# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

## අයදුම්පත් කැඳවීම

# උපකුලපති තනතුර

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින්, 1978 අංක 16 දරන පනතේ 34 වන වගන්තිය හා පසුව සිදු කරන ලද සංශෝධනයන්ට සහ කොමිෂන් සභා චක්‍රලේඛ 03/2023 නියමයන්ට අනුකූලව අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකි. ඔහු / ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගණන් දීමේ නිලධාරියා වේ. එමෙන්ම පාලක සභාව සහ සනාථන සභාව යන ආයතන දෙකෙහිම නිල බලයෙන් පත්වන සභාපතිවරයා ද වේ. විශ්වවිද්‍යාල පනතේ 1978 අංක 16 වන සංශෝධනය පරිදි උපකුලපතිවරයා ඔහුට/ ඇයට නියමිත කාලයට පෙර ධුරයෙන් ඉවත් වීමක් හෝ ඉවත් කරනු ලැබුවහොත් හැරෙන්නට වසර තුනක කාලයක් සඳහා ඔහු/ඇය ඔහුගේ/ඇයගේ හැටපස් වන වයස සම්පූර්ණ වන තුරු ධුරය දරයි. අධ්‍යයන නායකත්වය සැපයීම, කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය, හඳුන්වාදීම සහ මෙහෙය වීම, පාලක සභාව ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම ඇතුළු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සඳහා උපකුලපතිවරයා වගකිව යුතු බැවින් අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිද භාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය, ඵලදායී හා පක්ෂග්‍රාහී නොවන නායකත්වය යන මූල ධර්ම ඔහු/ ඇය සතු විය යුතුයි.

අදාල අපේක්ෂකයා/ අපේක්ෂිකාව ඉහළ මට්ටමේ පර්යේෂණ ධාරිතාවක්, නායකත්ව හැකියා, අන්තර් පුද්ගල සම්බන්ධතා, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ නිවැරැදි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීම ඇතුළු උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජයග්‍රාහී ඉතිහාසයක් ඇත්තෙකු විය යුතුය. සාරධර්ම හා විශ්වවිද්‍යාලයේ මෙහෙවර පිළිබඳ මනා අවබෝධයක් මෙන්ම ප්‍රජාව සඳහා කැපවීම ද ඔහු/ ඇය සතුව පැවතිය යුතු ය. (වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය : http:/www.seu.ac.lk වෙත පිවිසිය හැකිය.)

උපකුලපතිවරයා ඉහළම අධ්‍යයන වැටුප් පරිමාණයට සුදුසුකම් ලබා ඇති අතර, වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් සහ තනතුරට අදාල අනෙකුත් දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

පත්කිරීමේ ක්‍රියා පටිපාටිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2023 අප්‍රේල් 10 දිනැති 03/2023 කොමිෂන් සභා චක්‍රලේඛය පහත වෙබ් අඩවිය වෙත පිවිස ලබා ගත හැකිය.

https://ugc.ac.lk/attachments/2442_Commission%20Circular%20No.%2003-2023.pdf

අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 63 ට නොවැඩි විය යුතුය.

**අයදුම්පත් සමග පහත ලියකියවිලි අමුණා එවිය යුතුය.**

(I) අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ජීවදත්ත පත්‍රිකාවක්.

(ll) විශ්වවිද්‍යාලයේ දැක්ම පිළිබඳ පෞද්ගලික ප්‍රකාශයක් සහ උපකුලපති තනතුරට පත් කරනු ලැබුවහොත් ඔහු / ඇය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.

(III) වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු හෝ මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය හෙබ වූයේ නම්, ඔහුගේ / ඇයගේ කාර්යාලයේ පළමු කාල සීමාව තුළ දී සිදු කරන ලද ජයග්‍රහණ ඉස්මතු කෙරෙන වාර්තාවක් ඉහත (I), (ii) වගන්තියේ සඳහන් කර ඇති ලේඛනවලට අමතරව ලබා දිය යුතුය.

(iv) ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය හැර අනෙකුත් සේවා, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ උසස් අධ්‍යාපන ආයතන වල සේවය කරන අයදුම්කරුවෙකු අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයෙකු නම්, ඔහු / ඇය උක්ත තනතුරට පත් කරන අවස්ථාවේදී නිදහස් කළ හැකි ද යන්න සඳහන් කෙරෙන සේවා යෝජකගේ ලිපියක්.

උපකුලපති ධුරය සඳහා ඉල්ලුම් කළ අපේක්ෂකයින් විශේෂ පාලක සභා සැසිවාරයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතු අතර, අවම වශයෙන් විනාඩි දහයක (10) කට නොඅඩු නමුත් විනාඩි (15) නොවැඩි කාල සීමාවක් තුළ කෙටි ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුය. යම්කිසි සුවිශේෂී තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකුට විශේෂ පාලක සභා රැස්වීමට පෙනී සිටීමට හැකියාවක් නොමැති අවස්ථාවක ලේකම්වරයා වෙත කෙරෙන පූර්ව දැනුම් දීමකින් පසු, ඔහුට/ ඇයට අතථ්‍ය මාදිලිය (Virtual Mode ) මගින් පෙනී සිටීමට අවසරය ලැබේ.

ඉහත පරිදි අදාල ලියකියවිලි සහිත අයදුම්පත් ලේඛකාධිකාරී, අග්නිදිග විශ්වවිද්‍යාලය, ඔලුවිල් යන ලිපිනයට 11.03.2024 දින සවස 3.00 ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් / කුරියර් මාර්ගයෙන් හෝ පැමිණ භාර දිය යුතුය.

ඊට අමතරව අදාල උපකාරක ලේඛන ද සහිත මෘදු පිටපතක් PDF ආකෘතියෙන් යුක්ත ව registrar@seu.ac.lk ලිපිනයට ඊමේල් (Email) කළ යුතුය.

අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත අඩංගු ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ "**උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍රය**" ලෙස සඳහන් කළ යුතුය.

**එම්.අයි.නවුෆර්,**
**වැඩ බලන ලේඛකාධිකාරී හා කවුන්සිලයේ ලේකම්,**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය.**
**08.02.2024.**